මගේ අංකය - ..............................                                                  දිනය - ......................

------------------------------------------

------------------------------------------

------------------------------------------

*(ලංසුකරුගේ නම හා ලිපිනය)*

මහතාණෙනි/මහත්මියණි,

**විදුලි ජනක යන්ත්‍ර (Standby Power Generators) 4 ක් සපයා ගැනීම සහ ස්ථාපනය සඳහා මිලගණන් කැඳවීම**

සී /ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ග්‍රාමීය බැංකු / ප්‍රාදේශික පරිශ්‍රයන් හට, පහත සඳහන් විදුලි ජනක යන්ත්‍ර සපයා ගැනීම සහ ස්ථාපනය සඳහා අමුණා ඇති මිල ලේඛනයට අනුව මිල ගණන් කැඳවනු ලැබේ.

- 1 Phase Standby Power Generators (Rated Output Power 5kW) - 02
- 1 Phase Standby Power Generators (Rated Output Power 6kW) – 02

සෑම විදුලි ජනක යන්ත්‍රයක් සඳහාම ස්වයංක්‍රිය ජව හුවමාරු ස්විචයක් (ATS) අඩංගු පාලක පැනලයක් ඇතුලත් විය යුතුය. ජනක යන්ත්‍රයට ATS පාලක පැනලය අන්තර්ගතවී නොමැතිනම් එහි මිලගණන් මිල ලේඛනයේ වෙනම සඳහන් කිරීමටද හැකිය. ජනක යන්ත්‍ර සහ පාලක පැනලවල වගකීම් කාලසීමාවන් සහ පසු සේවා විස්තර (නිදහස් කාලසීමාවන්, අලුත්වැඩියා සහ අයකිරීම්) ඉදිරිපත් කලයුතු වේ.

මිල ගණන් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට මුද්‍රා තැබූ කවරයක් යටතේ එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**විදුලි ජනක 4 ක් සපයා ගැනීම සහ ස්ථාපනය සඳහා මිලගණන්**" යන වචන සලකුණු කළ යුතුය. මේ සඳහා පහත සඳහන් කාර්යාලයේ තබා ඇති මිලගණන් පෙට්ටියට බහාලීමෙන්ද මිල ගණන් ඉදිරිපත් කල හැකිය.. ලංසුකරුවන් තම මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා පිටුපස ඇති මිල ලේඛන ආකෘතිය භාවිතා කළ යුතුය.

**ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන**

- නිසි ලෙස සම්පූර්ණ කල මිල ලේඛණය
- නිසි ලෙස සම්පූර්ණ කල පිරිවිතර ලේඛණය
- ජනක යන්ත්‍ර සහ ATS පාලක පැනලයේ තාක්ෂණික ලේඛණ

**අවසන් වේලාව**

මිලගණන් පත්‍රිකා භාර ගැනීම 2026.03.25 දින ප.ව. 3.00 න් අවසන් වන අතර ඉන් පසු වහාම විවෘත කෙරේ. මෙම කාලයෙන් පසු ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිල ගණන් අවසන් වන වේලාවට පෙර පිරිවිතර ලේඛණය හා තාක්ෂණික තොරතුරු සැපයීමට අපොහොසත් වීමෙන් මිල ගණන් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

මිල ගණන් විවෘත කිරීම නැරඹීම සඳහා එක් එක් ලංසුව නියෝජනය කිරීම සඳහා පුද්ගලයින් දෙදෙනෙකුට වඩා සහභාගී වීමට අවසර නැත.

**ජනක යන්ත්‍ර සහ පාලක පැනල සැපයිය යුතු දිනය සහ ස්ථානය**

ප්‍රදානය කළ දින සිට සති 4ක් ඇතුළත, සී /ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ කුරුවිට ප්‍රධාන කාර්යාලය වෙත ජනක යන්ත්‍ර සහ ATS පාලක පැනල සැපයිය යුතුය. සඳහන් කර ඇති සම්පූර්ණ ප්‍රමාණයම එකවර ලබා දිය යුතු අතර, කොටස් බෙදා හැරීම් සඳහා ගෙවීම් සිදු නොකෙරේ.

**වලංගු කාලය**

ඉහත සඳහන් කළ අවසන් දින සිට මාස 03ක් සඳහා ඔබගේ මිලගණන් වලංගු විය යුතුය.

**රජයේ බදු**

කරුණාකර ඔබගේ VAT ලියාපදිංචි අංකය සහ SSCL ලියාපදිංචි අංකය මිල ගණන් සමඟ සඳහන් කරන්න. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද VAT සහ SSCL ලියාපදිංචි සහතිකයේ පිටපතක් මිල ගණන් සමඟ ඉදිරිපත් කළ යුතුය. (අදාළ නම්).

**සාමාන්‍යාධිකාරී ,**
**සී /ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය**
**ප්‍රධාන කාර්යාලය**
**කෙලින් වීදිය , කුරුවිට.**
**දු. අංක. -** 0452262242
**ඊ මේල් -** mpcs.kuruwita@gmail.com